# ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

## VII සභා වාරය හතළිස් අටවන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2022.02.08.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
14 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
19. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ හතළිස් අටවන සභාව සඳහා පැමිණි මන්ත්‍රී මණ්ඩලයත්, මාධ්‍යවේදී මහත්ම මහත්මීන් සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීනුත් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.01.11. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් 2022.01.11. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

08 වන පිටුවේ කල් දී ඇති යෝජනා තීරණ අංක (05) (iv) හි " 2021 වර්ෂයේ නොවැම්බර් මස රට විවෘත කලත් කොරෝනා මාර්ග උපදේශන නිසා හෝටල් සහ කෑම සපයන ස්ථාන විවෘත කිරිමට නොහැකි වූ නිසාත්, දෙසැම්බර් මස සංචාරකයන්ගේ පැමිණීම අඩු වූ නිසාත් බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල විවෘත නොකල බව සඳහන් කරමින් දෙසැම්බර් සහ නොවැම්බර් මාස සඳහා මාසික කුලිය අය නොකර, සහන සලසා දෙන ලෙසට නො 299, තොටගමපාර, හබරකඩ පී.කේ.එන්. ප්‍රියදර්ශන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව " යන සටහන

" 2021 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය පැතිර යාම පාලනය කිරීම උදෙසා අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් යන මාස රට වසා දමා තිබූ බැවිනුත්, සෞඛ්‍ය මාර්ගෝප නීති රීති අනුව හෝටල් සහ ආපනශාලා පවත්වාගෙන යාම තාවකාලිකව නවතා තිබූ බැවිනුත් එම මාස තුනත් ඇතුළුව නොවැම්බර් මස රට විවෘත කලත් කොරෝනා මාර්ග උපදේශන නිසා හෝටල් සහ කෑම සපයන ස්ථාන විවෘත කිරිමට නොහැකි වූ නිසාත්, දෙසැම්බර් මස සංචාරකයන්ගේ පැමිණීම අඩු වූ නිසාත් බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල විවෘත නොකල බව සඳහන් කරමින් දෙසැම්බර් සහ නොවැම්බර් මාස සඳහා මාසික කුලිය අය නොකර, සහන සලසා දෙන ලෙසට නො 299, තොටගමපාර, හබරකඩ පී.කේ.එන්. ප්‍රියදර්ශන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව " ලෙසට සංශෝධනය විය යුතු බව ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.01.11. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). සභා රිති අනුගමනය කරමින් රැස්වීම් කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කල යුතු බැවින් මාසික මහ සභා රැස්වීම පැවැත්වෙන අවස්ථාවල්වලදී රැස්වීමේ කටයුතු නීත්‍යානුකූල ආකාරයට පවත්වාගෙන යාම සඳහා නියමිත වේලාවට සහභාගී වීමට කාරුණික වන්න.

(ii). සභා රීති අනුව මහ සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කල නොහැකි අවස්ථාවල්වලදී එම යෝජනා කාරක සභා කමිටුවලට ඉදිරිපත් කර සාකච්ඡාවට බඳුන් කිරීමෙන් අනතුරුව එහි සංක්ෂිප්ත අදහස සහ අදාල යෝජනාව මහ සභාවට ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් කාරක සභා රැස්වීම් පැවැත්වෙන අවස්ථාවල් වලදී සාර්ථක අන්දමින් එම කමිටු කටයුතු පවත්වාගෙන යාමට මහජන නියෝජිතවරුන් එම කමිටු වලට සහභාගී වීම අත්‍යාවශ්‍ය බැවින් ඒ සඳහා සහභාගී වන්න. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා සෑම කමිටුවකට සහභාගී වන

අතර නොපැමිණෙන්නේ නම් ඒ බව දැනුවත් කිරීමට එතුමා පියවර ගන්නා බැවින් සභාපතිවරයා ලෙස මා එතුමාට විශේෂ ස්තූතියක් පිරිනමනවා.

(iii). පළාත් පාලන ආයතනවල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරමින් ඉදිරි පළාත් පාලන මැතිවරණයට මුහුණු දීම සඳහා බාහිර ආයතනවල අනුග්‍රහය මත මහජන නියෝජිතයන්ට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරිම සඳහා සභාව නියෝජනය කරනු ලබන සභිකයන්ගේ තොරතුරු රැස්කර ගැනීමට අවශ්‍ය බව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දන්වා එවා තිබෙනවා. ඒ සඳහා ඉදිරිපත් කර තිබෙන අයදුම්පත සම්පූර්ණ කර ලේකම්තුමිය වෙත භාර දෙන්න. එතුමිය විසින් අදාල තොරතුරු එම ආයතනය වෙත ලබා දිමට නියමිතයි.

(iv). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දුරකතන සහ අන්තර්ජාල පහසුකම් ඉතා දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රදේශයේ පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන් දුෂ්කරතාවයන්ට පත්ව ඇති බැවින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය විසින් පසුගිය සභාවාරයක දී යෝජනා කළා. ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් මා විසින් ඒ බව අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වා යැවීමට කටයුතු කල අතර ජනාධිපති කාර්යාලය විසින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙතට දැනුවත් කිරීමට පියවර ගැනීමත් සමඟ එම ආයතනය විසින් එම දැනුවත් කිරිම පිළිබඳව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට ස්තූතිය පල කර තිබෙනවා. එමෙන්ම ඉදිරියේ දී තාක්ෂණය මත පදනම් වන සමාජයක් සහ ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක් යන රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි 4G/Fiber පහසුකම් ලබාදීමේ අරමුණින් දියත් කර ඇති ගමට සන්නිවේදනය (Connect Sri Lamka) ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි නව සන්නිවේදන කුළුණු ඉදිකරනු ලබන බවත්, එමඟින් දුරකතන හා අන්තර්ජාල පහසුකම් ඉදිරියේ දී වැඩි දියුණු කිරිමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන බවත් දන්වා එවා තිබෙනවා.

(v). මද්‍යසාර, දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතය ජන ජීවිතය කෙරෙහි විශාල ලෙස හානිකර අයුරින් බලපාන බැවින්, නවකයින් මේ සඳහා යොමු වීමට පෙර වළක්වා ගැනිමටත්, දැනට භාවිතා කරනු ලබන්නන් එයින් වළක්වා ගැනිම සඳහාත් යෝජිත ක්‍රියාකාරකම් රැසක් ස්වේච්ඡා ආයතනයක් වන හෙල්දි ලංකා ආයතනය විසින් මහජන නියෝජිතවරුන්, මහජන නියෝජිතවරියන් සහ කාර්ය මණ්ඩලය සහභාගි කරවා ගනිමින් ඉදිරි දිනකදී වැඩමුළුවක් පැවැත්වීමට බලාපොරොත්තු වන අතර එම දිනය ඉදිරියේ දී දැනුම් දීමට කටයුතු කරනවා. ඒ සඳහා සහභාගී වන්න.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විධායක ඉංජිනේරු කාර්යාලය විසින් සිදු කරනු ලබන කොන්ත්‍රාත් කර්මාන්තවල ප්‍රමිතිය තහවුරු කිරිම මේ වන විට සිදු නොවන බවත්, සංවර්ධනය කරනු ලබන ගුරුබැවිල මාර්ගය, මද්දේගම මාර්ගය, තෝරවෙල කන්ද මාර්ගය, නෙල්ලිවල මාර්ගය යන මාර්ගයන්හි උරහිස් නිසි ප්‍රමිතියට සිදු නොවන බව සඳහන් කරමින් එම මාර්ගයන් කෝර්කටින් පරීක්ෂාවක් මඟින් තහවුරු කිරීමෙන් පසුව ගෙවීම් නිර්දේශ කිරිම සුදුසු බව පසුගිය සභාවාරය තුලදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාගේ ඉල්ලිම පරිදි පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය සබරගමුව පළාත් සභාව වෙත දන්වා යවන ලදි. ඒ පිළිබඳව සොයා බලා කඩිනමින් වාර්තාවක් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙසට සබරගමුව පළාත් සභාව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත දන්වා යවමින් එහි පිටපතක් ඉඹුලපේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරමින් එම ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ඒ පිළිබඳව මහ සභාව දැනුවත් කිරීමට පියවර ගන්නා ලදි.

(04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

(i). මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද වවුචර් වාර්තාවල අනු අංක කිහිපයක් පිළිබඳව පැහැදිලි කර ගැනීම් අවශ්‍ය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ ඉල්ලීම අනුව සකස් කරන ලද තොරතුරු ඇතුළත් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ඒ පිළිබඳව අදහස් දක්වමින්,

- **ගැට්ටපාන හංදියේ නාන පිල්ල අසල කුණු කසල දැමීම තහනම් යනුවෙන් දැන්වීම් පුවරුවක් සවි කිරීම.**

  අනු අංක 03 සහ 06 යටතේ ගෙවීම් සිදු කරන ලද ගැට්ටපාන හංදියේ නාන පිල්ල අසල කුණු කසල ගෙනත් දැමීම දැඩි ගැටළුවක් බවත්, එය වැළැක්වීමට දැන්වීම් පුවරුවක් සවි කර දෙන ලෙස ප්‍රදේශවාසින් ඉල්ලීමක් සිදු කරන ලදි. එම දැන්වීම් පුවරුව සැකසීමේ දී වෙළඳපලේ ද්‍රව්‍ය වල මිල වරින් වර ඉහල යාම නිසා නිෂ්පාදන වියදම් සඳහා රු. 5000 ට වැඩි බිලක් ගෙවීමට සිදු වූ බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ක්‍රියාත්මක වීමේ දී දීර්ඝ කාලයක් ගතවන බැවින්, එම දැන්වීම් පුවරුව සඳහා වූ වියදම් බිල් දෙකක් මගින් අදාල අවශ්‍යතාවයට ගෙවීම සිදු කරන ලදි.

- **අනු අංක 07 සහ 85 යටතේ කසල අංගනය සඳහා වල්පැළ නාශක මිලදී ගැනීම.**

කසල අංගන භූමියේ වර්ධනය වන වල් පැළ මර්ධනය සඳහා වරින් වර අවශ්‍යතාවය ඇතිවන අවස්ථාවල්වලදී පමණක් වල් නාශක යෙදීම සිදු කරනු ලබයි. එහිදී ඇතැම් වල්පැළ වර්ග මර්ධනය සඳහා ග්‍රැමොක්සෝන් යෙදිමට සිදුවේ. එහිදී අවශ්‍යතාවය අනුව මෙම මිලදී ගැනීම සිදු කරන ලදි.

- **ප්‍රාදේශීය සභාව සෞඛ්‍ය අංශය හා කාර්යාලය සඳහා ගත් සබන් කැට මිලදී ගැනීම.**

2021.12.02. දින බිල්පත් අංක 60041 මගින් ලයිෆ්බෝයි සබන් කැට 30 ක් හා මාක්ස් මිලදී ගත් අතර 2021.12.03. දින ඊට අදාල ගෙවීම් වවුචරය සකසා ඇත. 2022 වර්ෂය සඳහා නව සැපයුම්කරුවන් ලියාපදිංචි කර නැවත ප්‍රසම්පාදන කමිටුවක් පවත්වා නව මිල ගණන් ලබා ගැනීමට කාලයක් ගතවන බැවින් 2022 වර්ෂයේ මුල් මාස සඳහා එම ද්‍රව්‍ය මිලදී ගෙන ඇති බව දන්වා සිටිමි.

- **LF – 6966 දරණ සභාවේ TATA කැබ් රථය 2021/12/06 දින ධාවනය කිරිමට හැකිවන පරිදි කඩිනමින් අලුත් වැඩියා කිරිම.**

LF – 6966 දරණ සභාවේ TATA කැබ් රථය 2021 දෙසැම්බර් මාසය පුරා කොරෝනා එන්නත්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ නිවේදන කටයුතු සඳහා යොදවා තිබූ බැවින් 2021/12/06 වන දින රේඩියේටරයේ ඇති වූ දෝෂය කඩිනමින් අලුත්වැඩියා කර රාජකාරී කටයුතු සඳහා යොදවන ලදි. ඉන්පසු නැවතත් 2021/12/10 වන දින ධාවනයේ දී ඇති වූ දෝෂයක් නිසා අලුත්වැඩියාවට යොමු කිරීමට සිදු වූ අතර එම අවස්ථා දෙකෙහි දීම ඒ වන විට අලුත්වැඩියා කිරීමට තිබූ සියල්ලම අලුත්වැඩියා කිරිමට පියවර ගන්නා ලදි.

- **පෙර පාසල් ළමුන්ට ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා බෑග් මිලදී මිලදී ගැනීම.**

2021 වර්ෂයේ පෙර පාසල් ළමුන්ගේ විසිර යාමේ උත්සවය සඳහා දරුවන්ට ත්‍යාග ලබා දෙන ලෙස 2021.12.15. වන දින පෙර පාසල් පාලිකාව විසින් ඉල්ලීමක් කරන ලදි. මෙය 2022.01.24. දින පැවැත්වීමට දින යොදා තිබූ බැවින් මිල ගණන් කැඳවා ත්‍යාග මිලදී ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොමැති විය. ත්‍යාග සඳහා පාසල් බෑග් මිලදී ගැනීමටත් මෙය හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා අප ආයතනයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනිමට සභාපතිතුමාගේ අනුමැතිය ලැබුණි.

ඒ අනුව පෙර පාසල් පාලිකාවගේ ඉල්ලීම අනුව බෑග් 10 ක් මිලදී ගැනීමට සිදු වූ අතර බිල්පතෙහි වටිනාකම වන රු. 8500/- වූ මුදල බිල්පත් දෙකක් ලෙස සකස්කර ලබා ගැනීමට සිදු විය. එසේ සිදු කිරීමට හේතු වූයේ මිල ගණන් කැඳවීමකින් තොරව මිලදී ගත හැක්කේ එක් වරකට රු. 5000/- ට අඩු මිලදී ගැනීම් පමණක් බැවිනි. ඉහත කරුණු නිසා මෙම ගෙවීම බිල්පත් දෙකකින් ගෙවීම් සිදු කරන ලද බව කාරුණිකව දන්වා සිටිනවා.

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු සම්බන්ධයෙන් වෙනත් විමසීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කලත්, වෙනත් කිසිදු විමසිමක් සිදු නොවුණි.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ගිණුම් කරන ප්‍රමිත වලට අදාලව හා ප්‍රාදේශීය සභා සඳහා වන මූල්‍ය හා පරිපාලන රීතිවලට අනුකූල වන පරිදි 2021 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය සහා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

2021 වර්ෂයට අදාලව සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 වර්ෂයට අදාලව සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය සභා සම්මත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ප්‍රාදේශීය සභා සඳහා වන මූල්‍ය හා පරිපාලන රීතිවලට අනුකූල වන පරිදි 2021 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය විධිමත්ව 2022 වර්ෂයේ ජනවාරි මස 31 දිනෙන් අවසන් කිරීමට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් දෙන ලද උපදෙස් අනුව, භාණ්ඩ සමීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුමත කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021 වර්ෂයට අදාලව විධිමත් පරිදි පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීමටත්, ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් අදාල වූ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා පෙර පාසලේ, පෙර පාසල් පාලිකා තනතුරු දෙකෙන්, එක් තනතුරක් දැනට පුරප්පාඩුව පවතින බැවිනුත්, එම පෙර පාසල් පාලිකා තනතුර සඳහා අයදුම්පත් ලැබී ඇති බැවිනුත්, සුදුසුකම්ලත් අයදුම්කරුවෙකු තෝරා පත් කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කරගැනීමටත් ඒ සඳහා ඩී.ඒ.සී.ආර්. දසනායක ලේකම්තුමිය, ප්‍රධාන සංවර්ධන නිලධාරි යූ.ඩී.එන්. පුෂ්ප කුමාර මයා, පූර්ව ළමා විය සංවර්ධන නිලධාරි ඩබ්ලිව් තිළිණි චතුරංගි මිය, විෂය භාර නිලධාරි සංජීවනී පුෂ්පලතා මහත්මියගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

පෙර පාසල් පාලිකාව තෝරා ගැනීම සඳහා නම් කරන ලද නිලධාරින්ගෙන් සැදුම්ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභා පෙර පාසලේ, පෙර පාසල් පාලිකා තනතුරු දෙකෙන්, එක් තනතුරක් දැනට පුරප්පාඩුව පවතින බැවින් එම තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවෙකු තෝරා පත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා නම් කරන ලද  ලේකම්, ඩී.ජී.සී.ආර්. දසනායක, ප්‍රධාන සංවර්ධන නිලධාරි යූ.ඩී.එන්. පුෂ්ප කුමාර මයා, පූර්ව ළමා විය සංවර්ධන නිලධාරි ඩබ්ලිව් තිළිණි චතුරංගි මිය, විෂය භාර නිලධාරි සංජීවනී පුෂ්පලතා මහත්මියගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iv). තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව පදනම් කරගනිමින් 2022 – 2025 යන ඉදිරි වර්ෂ කිහිපය ඇතුලත ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් ලඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන්ගෙන් සමන්විතව සකස් කරන ලද ඒකාබද්ධ උපායමාර්ගික සැලැස්ම ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

2022 – 2025 යන ඉදිරි වර්ෂ සඳහා සකස් කරන ලද ඒකාබද්ධ උපායමාර්ගික සැලැස්ම අනුමත කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 – 2025 යන ඉදිරි වර්ෂ සඳහා සකස් කරන ලද ඒකාබද්ධ උපායමාර්ගික සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). බලංගොඩ, පින්නවල, එලුගාලතැන්න ගමතුල පිහිටි පින්නවල රජයේ බෙහෙත් ශාලා ගේට්ටුව අසල සිට උඩගම ජාතික පාසල වෙත යාම සඳහා මෑතක දී රජය විසින් සංවර්ධනය කරන ලද අඩි දහයක් පමණ පළලින් යුතු මාර්ගය අංග සම්පූර්ණව නිම කර නොමැති බැවින් එම මාර්ගය කඩිනමින් කොන්ක්‍රීට් කර, හෝ තාරදමා සංවර්ධනය කර දෙන ලෙසත්, සමඟි මාවත ලෙස මාර්ගය නම් කර නාම පුරුවක් සවි කර දෙන ලෙසත් පින්නවල සමඟි සුභ සාධක සමිතියේ ගරු ලේකම්, කේ.එච්. විමලදාස මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරමින් මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ගම සමඟ පිළිසඳර වැඩසටහනට යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

බලංගොඩ, පින්නවල, එලුගාලතැන්න ගමතුල පිහිටි පින්නවල රජයේ බෙහෙත් ශාලා ගේට්ටුව අසල සිට උඩගම ජාතික පාසල වෙත යාමට ඇති මාර්ගය සමඟි මවත ලෙස නම් කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර  මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව බලංගොඩ, පින්නවල, එලුගාලතැන්න ගමතුල පිහිටි පින්නවල රජයේ බෙහෙත් ශාලා ගේට්ටුව අසල සිට උඩගම ජාතික පාසල වෙත යාමට ඇති මාර්ගය සමඟි මාවත ලෙස නම් කිරීමටත්, මාර්ගය සංවර්ධනය කිරිම සඳහා ගම සමඟ පිළිසඳර වැඩසටහනට යෝජානාවක් ලෙස ඉදිරිපත් කිරීමටත් අදාල යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). පින්නවල කුඩා නගරය නිර්මාණය කිරිමේ කටයුතු සඳහා යෝජිත ඉඩම් කොටස අත්පත්කර ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර ඒ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන්

රු.29950.00 ක මුදලක් ගෙවා භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගැනිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අදාල මුදල ගෙවා භූමි යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා සුදුසු බව විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව පින්නවල කුඩා නගරය නිර්මාණය කිරිමේ කටයුතු සඳහා යෝජිත ඉඩම් කොටස අත්පත්කර ගැනීමේ කටයුතු සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් රු. 29 950.00 ක මුදලක් ගෙවා භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගැනිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vii). ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන රත්මලවින්න හියුම් බට අංගනයේ නිෂ්පාදන කටයුතු සඳහාත්, සභාවේ හදිසි අවශ්‍යතාවයන් අනුව වෙනත් ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහාත් සිමෙන්ති මිලදී ගැනිමට අදාලව සැපයුම් කරුවන් ලියාපදිංචි වී ඇති අතර, වර්තමාන වෙළඳපලේ වරින් වර මිල ගණන් වෙනස්වීම, වෙළඳපලේ පවතින හිඟතාවය අනුව සැපයුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කර නොමැති බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දිගටම ක්‍රියාත්මක කරමින් හදිසි අවශ්‍යතාවයන් සඳහා පමණක් වෙළඳපලේ පවතින මිලට සිමෙන්ති මිලදී ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
රත්මලවින්න හියුම් බට අංගනයේ වැඩ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමටත්, හදිසි අවශ්‍යතාවයන් සඳහා පමණක් වෙළඳපලේ පවතින මිලට සිමෙන්ති මිලදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය විසින් එම යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඒ අනුව විශේෂ මිලදී ගැනීමේ අවස්ථාවල්වලදී තිදෙනෙකුගෙන් යුක්ත ( විෂය නිලධාරි, ප්‍රධාන සංවර්ධන නිලධාරි, කාර්මික නිලධාරි) කමිටු නිර්දේශය මත සහා රීති අනුව නීත්‍යානුකූල ආකාරයට හදිසි මිලදී ගැනීමක් ලෙස සභාවේ ලියාපදංචි සැපයුම්කරුවන්ගෙන් පමණක් ඇණවුමක් ලබා දී සිමෙන්ති මිලදී ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
සිමෙන්ති මිලදී ගැනීමෙන් අනතුරුව එම මිලට බිල්පත් ලබා ගැනීමට කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
වෙළඳපලේ නියමිත මිලට වඩා වැඩියෙන් සිමෙන්ති අලෙවි වෙනවා. එම නිසා අනෙකුත් සභා සමඟ සාකච්ඡා කර මිලදී ගැනීමට කටයුතු කරන්න.

ඒ අනුව හදිසි අවශ්‍යතාවය මත වෙළඳපලේ පවතින මිලට තිදෙනෙකුගෙන් (විෂය නිලධාරි, ප්‍රධාන සංවර්ධන නිලධාරි, කාර්මික නිලධාරි) යුක්ත කමිටු නිර්දේශය මත සහා රීති අනුව හදිසි මිලදී ගැනීමක් ලෙස සභාවේ ලියාපදංචි සැපයුම්කරුවන්ගෙන් පමණක් ඇණවුමක් ලබා දී සිමෙන්ති මිලදී ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(viii). හදිසි ගිනි ගැනීම් වලදී එම ගින්න පැතිරීම වළක්වාලිම සඳහාත් වන සතුන් ගම් වැදීමෙන් ගම ආරක්ෂා කර ගැනිම සඳහාත් ජීව ආරක්ෂිත පද්ධතියක් ලෙස හන පැළ රෝපණය සඳහා කැපොක්වත්ත

කසල අංගනය තුල හණ පැළ 5000 ක තවානක් රෝපනය කිරීමට අදාලව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ඒ සඳහා කඩිනමින් ඇස්තමේන්තුවක් කල යුතු බව ප්‍රකාශ කරන ලදි.
කැපොක්වත්ත කසල අංගනය තුල හණ පැළ 5000 ක තවානක් රෝපනය කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
බල ප්‍රදේශය තුල වනාන්තර ගිනි ගැනිම් සිදු වන නිසා එම ගිනි ගැනීම් පැතිරීම වැළැක්වීම සඳහා වන සතුන් ගම් වැදිම වළක්වා ගැනිමට හැකියාව පවතින බැවින් ජීව ආරක්ෂිත ශාක වැටක් හණ පැළ රෝපනය කිරීමටත්, කැපොක්වත්ත කසල අංගනය තුල හණ පැළ තවානක් සකස් කිරීමට අවස්ථාව සකසා දෙන්න.

ඒ අනුව කැපොක්වත්ත කසල අංගනය තුල හණ පැළ 5000 ක තවානක් පරිසර ගිණුමේ ප්‍රතිපාදන යටතේ රෝපනය කිරිම හා ඒ සඳහා කඩිනමින් ඇස්තමේන්තුවක් සකස් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ix). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සතු පානීය ජල ව්‍යාපෘති වල නව ජල සම්බන්ධතා ලබා දිම සඳහාත්, අක්‍රිය වන ජල මීටර් නැවත ස්ථාපිත කිරිම සඳහාත් නව ජල මීටර් 100 ක් මිලදී ගැනිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ නව ජල මීටර් 100 ක් මිලදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යොජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ නව ජල මීටර් 100 ක් මිලදී ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(x). රත්මලවින්න (ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සිදු කරනු ලබන කම්කරුවන්හට එක් අයෙකුට රු. 12000.00 ක් බැගින් දෙදෙනාටම දැනට ගෙවනු ලබන මාසික දිමනාව එක් අයෙකුට රු.20000.00 දක්වා වැඩි කර ගෙවන ලෙසට, ඒ ආර්. හින්මහත්මයා සහ එච්.කේ. පියදාස මහතා යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් දැනට ඔවුන්ට ගෙවනු ලබන රු. 12000.00 ක දිමනාව එක් අයෙකුට රු. 15000.00 ක් වශයෙන් වැඩිකර දෙදෙනාට ම 2022 වර්ෂයේ මාර්තු මහ සිට ගෙවිම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

දැනට එම කම්කරුවන් දෙදෙනාගෙන් එක් අයෙකුට රු. 12 000.00 ක් බැගින් දෙදෙනාටම ගෙවනු ලබන දිමනාව රු. 15000.00 ක් බැගින් වැඩි කර ගෙවිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යොජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව දැනට එම කම්කරුවන් එක් අයෙකුට රු. 12 000.00 ක් බැගින් දෙදෙනාට ගෙවනු ලබන දිමනාව එක් අයෙකුට රු. 15 000.00 ක් බැගින් වැඩි කර දෙදෙනාටම ගෙවිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(xi). 2021 වර්ෂ අවසාන මූල්‍ය විගණන වාර්තාව අනුව තැන්පත් ලේඛනයේ ශේෂව ඇති කල් පසු වී ඇති නමුත් මේ දක්වා ගෙවා නොමැති රු. 18951.00 ක මුදලක් නියාදනය කර නොමැති බවට දන්වා විගණන අංශය විසින් පෙන්වා දී බවත්, ඊට අදාල මුදල් විස්තරයන් පහත පරිදි වන බවත් දන්වා සිටිමින්,

01. 2014 දියපහස ගිමන්හල වෙනුවෙන් 2014 වර්ෂයේ තැන්පත් කල මුදල රු. 5084.50 ( මේ දක්වා ඉහත මුදල් ආපසු ගනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බැවින් 2022.02.28. දිනට රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා)
02. හෙලපත්දෙණිය මූකලාන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් මඟින් කපා සංවර්ධනය කිරීමේ ව්‍යාපාතිය වෙනුවෙන් තැන්පත් කල මුදල රු.13866.91

එම මුදල් රාජ්‍ය ආදායමට එක් කර ගැනීමට අදාලව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

කල් පසු වී ඇති තැන්පත් 18951.00 ක රාජ්‍ය ආදායමට බැර කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කල් පසු වී ඇති තැන්පත් 18951.00 ක රාජ්‍ය ආදායමට බැර කිරිමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(xii). 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමික්ෂණයේ අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරිම හා ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා පහත නිලධාරින්ගෙන් යුත්

01. එම්.එන්. මුණසිංහ මයා
02. යූ.ඩී. නිලන්ත පුෂ්ප කුමාර මයා
03. එල්.කේ.ටී.කේ. ආරියදාස මිය
04. එම්. ලක්ෂිත තරිඳු මයා
05. එම්.පී. දෙල්ගහතැන්න මයා
06. ජේ.එච්.ඒ. මධුෂානි මිය

යන නිලධාරි මහත්ම මහත්මින්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර ගැනීමටත්, 2022.03.04. වන දින ඊට අදාල කටයුතු සඳහා දින යොදා ගැනිමටත් අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

නම් කරන ලද නිලධාරි මහත්ම මහත්මින්ගෙන් යුත් කමිටුවක් පත් කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමික්ෂණ මණ්ඩලයේ තීරණය අනුව අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරිම හා ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා එම්.එන්. මුණසිංහ මයා, යූ.ඩී. නිලන්ත පුෂ්ප කුමාර මයා, එල්.කේ.ටී.කේ. ආරියදාස මිය, එම්. ලක්ෂිත තරිඳු මයා, එම්.පී. දෙල්ගහතැන්න මයා යන නිලධාරින්ගෙන් යුත් කමිටුවක් පත් කර ගැනීමේ සහ 2022.03.04. වන දින ඒ සඳහා යොදා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද ජනවාරි මස 01 වන දින සිට ජනවාරි මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 51 දක්වා සහ වවුචර් අනු අංක 01 - 60 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ ගෙවිමට ඇති වවුචර් අනු අංක 01 – 19 දක්වා වවුචර් උපලේඛන 2021.12.06. වන දින පැවැති මුදල් කමිටුවට

ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී .
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමන්,
ජනවාරි මස 01 වන දින සිට ජනවාරි මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 30 සහ 31 යටතේ 2021 දෙසැම්බර් මසට අදාලව යූ.පී.ආර්.පී. අබේරත්න පරිවර්තිත ගමන් වියදම් ගෙවීම යනුවෙන් එකම කාරණයක් අවස්ථා දෙකක දී සටහන් වී තිබෙනවා. ඒ පිළිබඳව පැහැදිලි කරන්න.

මුදල් කමිටුවට ඉදිරිපත් කරනු ලබන වවුචර් වාර්තාවල අනු අංක දෙකක එකම නමකින් ගෙවීම් සටහන් වී ඇති බැවින් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට පත් විය.

එම සාකච්ඡාවෙන් අනතුරුව, ගරු සභාපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට පත් විය.

ඒ අනුව කාරක සභා අවස්ථාවේ දී විෂය නිලධාරි සහා ගර්භයට පැමිණීමෙන් පසුව, අත්වැරදීමක් නිසා එකම නමකින් ජනවාරි මස 01 වන දින සිට ජනවාරි මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 30 සහ 31 යටතේ 2021 දෙසැම්බර් මසට අදාලව යූ.පී.ආර්.පී. අබේරත්න මෙනෙවියට පරිවර්තිත ගමන් වියදම් ගෙවීම යනුවෙන් ස්ථාන දෙකක එකම නමකින් සටහන් වී ඇතත්, එම ගෙවීමේ එක් සටහනක් ඩබ්ලිව්.ආර්.පී. විජේසිංහ මහතාට ගෙවිය යුතු පරිවර්තිත ගමන් වියදම් බවට වෙනස් විය යුතු බව විෂය නිලධාරි විසින් ප්‍රාකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මෙවැනි සිද්දීන් පිළිබඳව විමසීම පිළිබඳව ඔබතුමාට ස්තූතිය ප්‍රකාශ කරනවා. මෙම ගෙවීමේ දී කිසිදු මුදල් වංචාවක් සිදු වී නැහැ. මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද ලේඛනයේ අත්වරදකින් දෙදෙනෙකුට ගෙවන ලද මුදල් ගෙවීම් පිළිබඳව එකම නමකින් සඳහන් වී ඇති බව තහවුරු වී ඇති බැවින් එය නිවැරදි විය යුතු බවත්, මින් ඉදිරියේ දී මෙවැනි අත්වැරදීම් සිදු නොවීමට වග බලා ගන්නා ලෙසට ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව මුදල් කමිටු අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

### (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.01.31. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

01. ප්‍රධාන කාර්යාලය සඳහා එදිනෙදා පාවිච්චි කරන ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
02. හියුම් පයිප්ප අංගනයේ හියුම් පයිප්ප නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

03. නව සභා ගර්භය සඳහා විදුලි පංකා මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
04. RD 8001 ට්‍රැක්ටර් රථය සඳහා වැසි ආවරණ වහලක් සකස් කිරීම හා සවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම.
05. ප්‍රධාන කාර්යාලය සඳහා ලදුපොත් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
06. ප්‍රධාන කාර්යාලය සඳහා ටෝනර් හා තීන්ත මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
07. කුමාරතුංග පුස්තකාලය සඳහා පරිගණක උපාංග මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
08. මන්ත්‍රී ප්‍රතිපාදන සංවර්ධන වැඩසටහන් සඳහා ලී වර්ග මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
09.ප්‍රාදේශීය සභාවේ ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා විදුලි බල්බ මිලදී ගැනීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහා අනුමැතිය ලබා ගැනිම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.අජිත් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2022 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිම.
01. ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා යන ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් අසනීප වී ඇති බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනය මඟින් දැනුම් දී තිබෙනවා. ඔවුන්ගේ නිවාඩු අනුමත කිරීමට අදාලව ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද නිවාඩු ඉල්ලුම් කිරීමේ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් නිවාඩු අනුමත කිරිමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,

මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන ප්‍රතිපාදන ඔස්සේ වැගපිටිය ග්‍රාමසේවා වසම තුල ග්‍රාම නිලධාරි කාර්යාලය පිහිටා ඇති සභාවට අයත් ඉඩමෙහි සති පොලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් පවතින අතර, එම ස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා බාධාවක් වී ඇති විශාල මහෝගනී ගස් දෙක ඉවත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සලසන්න.

පසුගිය 04 වනදා අයිතිකරුවන් නොමැතිව අයාලේ මහ මඟ සැරිසරණ ගවයෙක් මහ මඟ මැරී වැටී සිටියා. එහෙත් එම ගවයා එම ස්ථානයෙන් ඉවත් කිරීමට කිසිවෙක් ඉදිරිපත් නොවීම නිසා කොට්ඨාශය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයා ලෙස මමත්, වසම භාර ග්‍රාම නිලධාරිවරයාත් එම අවස්ථාවට සහභාගි වී අයිතිකරුවන් දැනුවත් කිරිමට කටයුතු කළා. මෙම ගවයන් රත්මලවින්න ප්‍රදේශයෙන් පැමිණෙන ගවයන්. අයිතිකරුවන් නොමැතිකම නිසා අයාලේ මහ මඟ සැරිසරනවා. එහෙත් ගව පැටවු ඉපදුණු පසුව අයිතිකරුවන් පැටියා ලබා ගැනීමටත් කිරිටික ලබා ගැනීමටත් කටයුතු කරන අතර නැවත පසුව මුදා හරිනවා.

එම ගවයන් විධිමත් පරිදි ගාල් කර රැක බලා ගනිමින් කිරි නිශ්පාදනයට දායක කර ගැනීම, සත්ත්ව අපද්‍රව්‍ය පොහොර නිශ්පාදනයට දායක කර ගැනීමට හැකි බැවින් අයිතිකරුවන් නොමැතිව අයාලේ මහමඟ සැරිසරණ ගව සම්පත ගාල් කර ආරක්ෂා කිරිම සඳහා සුදුසු ඉඩම් කොටසක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් හල්පේ කොස්ගම ප්‍රදේශයේ මැණික් ලබා ගැනීමට පතල් කැණිම් කටයුතු සිදු කිරිම නිසා මාර්ගය අවහිර වී තිබුණා. එම තත්ත්වය නිරාකරණය කිරිම සඳහා කමිටුවක් පත්කිරීමට කටයුතු කරන බවත් එමගින් තීරණයක් ගන්නා බවත් පසුගිය සභාවාරයේ දී ගරු සභාපතිතුමා ප්‍රකාශ කලා. එහි වර්තමාන තත්ත්වය කෙසේද ? මාර්ගයට සිදුව ඇති හානිය වෙනුවෙන් කුමක් කරන්නේද?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් කමිටුව කැඳවූ අතර, රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුව පැවැත්වුණා. ඒ සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාපතිවරයා වශයෙන් මමත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමාත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාත්, ප්‍රාදේශීය සහකාර අධයක්ෂ, මැණික් හා ස්වර්ණාභරන අධිකාරියේ ක්‍රියාත්මක නිලධාරින්, වන සංරක්ෂණ හා වන ජීවි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, සමනලවැව පොලිස් ස්ථානාධිපති, කෘෂි කර්ම දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ගොවිජන සේවා සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරි, පතල් හිමිකරු සහ ඔහුගේ නියෝජිතයෙක් සහභාගී වුණා.

පතල් කැණිම් කටයුතු සිදු කිරීමේ දී යම් යම් අතපසුවීම් සිදු වී ඇති බව කමිටුව පිළි ගත්තා. පතල් කැණිම් සිදු කරනු ලබන ගොඩ ඉඩමට යන්ත්‍ර සූත්‍ර යොදා කැණිම් කිරීමට බලපත්‍ර ලබා ගෙන ඇති අතර, කුඹුරු ඉඩමට යන්ත්‍ර සූත්‍ර යෙදීමෙන් තොරව සාමාන්‍ය පරිදි කැණිම් කිරීමටත් අවසර ලබාගෙන තිබුණා.
ඉඩම පිළිබඳ නිශ්චිතභාවයක් නොමැති නිසා ඉඩම මැනුම් කටයුතු සිදු කර ඉඩම් කොටස නිශ්චිත කිරීමටත්, බොර වතුර ගම්මානයට ගලා බසින බැවින් වතුර රඳවා තබා ඇති වේල්ල කඩා ඉවත් කිරීමටත්, ගොඩ ඉඩමට යන්ත්‍ර සූත්‍ර යොදන්නත් කුඹුරට යන්ත්‍ර සූත්‍ර යෙදීමෙන් තොරව ශිල්පීය ක්‍රම භාවිතා කරමින් පතල් කැණිම් කටයුතු සිදු කිරීම සුදුසු බව තීරණය කරන ලදී. මෙම හේතු නිසා සති දෙකක කාලයක් එම කටයුතු කිසිදු ක්‍රියාකාරකමක් නොකර නවතා දැමීම සුදුසු බවත් තීරණය කරන ලදී.

ප්‍රාදේශීය සභා පනතේ අංක 21 (i), 21 (ii), සහ 22 යන වගන්ති ප්‍රකාරව වෙනත් කිසිදු අධිකාරියකට මාර්ග අයත් නොමැතිනම් එම මාර්ග සඳහා සිදු වී ඇති හානිය ප්‍රතිපූර්ණය කරවා ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය පැවරී ඇති බැවින් ඒ බව පතල් හිමිකරුවන් වෙත දැනුම් දීමට කටයුතු කලා.
දැනුම් දෙන ලද තීරණ ක්‍රියාවට නංවා ඇත්නම් බලපත්‍රය ලබා දී නැවත පතල් කැණීම් කටයුතු සිදු කිරීමට අවසර ලබා දීමටත්, එසේ නොමැතිනම් බලපත්‍රය අහෝසි කරන ලෙස කමිටුව විසින් ජාතික මැණික් සංස්ථාවට දැනුම් දෙන ලදී.

නැවත වාරයක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
මාධ්‍ය විසින් විමසා බැලූ පසුවයි ඔබතුමන්ලා එම ස්ථානය පරීක්ෂාවට ලක් කලේ. එම ඉඩම පිළිබඳ නිශ්චිතතාවයක් නොමැති බව ඔබතුමා පවසනවා එසේනම් කෙසේ ද එම ඉඩමට බලපත්‍ර ලබා දුන්නේ?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
පතල් කැණීම් කටයුතු සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය සිදු කර ඇත්තේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසිනි.

නැවත වාරයක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
පසුගිය වර්ෂයේ ගරු සභාපතිතුමා ඇතුළුව තවත් කිහිපදෙනෙක් විදේශගතවීම පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලට සිදු වූයේ කුමක්ද?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
විදේශ පුහුණුවට සහභාගී වීමට අවස්ථාව උදා වී තිබුණු අතර එම යෝජනාව මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත්තත් ලොව පුරා පැතිර පැවැති කොරෝනා වසංගත තත්ත්වය නිසා එම අවස්ථාවට සහභාගී විමට නොහැකි වුණා. ඒ සඳහා වෙන් කරන ලද මුදල වැය නොකිරීම නිසා සභා අරමුදලේ පවතින බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
සභාවට අයත් ඉඩම් වෙනත් අය භුක්ති විඳීම නිසා සභාවට ඉඩම් අහිමිවෙගෙන යන බැවින් ඒවා පිළිබඳව කඩිනමින් සොයා බලා එම ඉඩම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ගන්න.

වෛරස් උණ සමඟ ඔමික්‍රොන් වෛරසය සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතිනවා. දූර්මත සහ මිත්‍යා මත දරමින් බල ප්‍රදේයේ ජනතාව එන්නත් මාත්‍රා තුනම ලබා ගෙන නොමැති නම් කඩිනමින් එන්නත් කරවා ගැනීම පිළිබඳව සභාව මැදිහත් වී අවශ්‍ය දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන්න. එමෙන්ම මේ අවස්ථාව වන විට බල ප්‍රදේශයේ ජනතාවගෙන් කොපමණ ප්‍රමාණයක් එන්නත්කරණයට ලක් ව සිටීද? ලක් නොවූ ප්‍රමාණය කොපමණද? වශයෙන් දැන ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාබී ජනතාවට නිවාස ආධාර ලබා දීම සඳහා නිවාස හා සංවර්ධන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවල ප්‍රගතිය කෙසේද? පැහැදිලිකිරීමක් සිදු කරන්න.

බල ප්‍රදේශය තුල කුඹුරු ආශ්‍රිතව සිදු කරන ලද වගා කටයුතු වල රෝග පැතිරෙමින් පවතිනවා. ගොවි නියාමකවරුන්ගේ ක්‍රියාකාරී සහයෝගය නොළැඹෙන බව දක්නට තිබෙනවා. හිතුමතේට එම කාර්යන්හි නිරතවන බව දක්නට ලැබෙන අතර ගොවි ජනතාවගෙන් පැමිණිලි ඉදිරිපත් වන බැවින් මෙම ගැටලු විසඳාලීමට අවධානය යොමු කරන්න.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා අදහස් දක්වමින්,

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා තිබූ පුරන් වූ කුඹුරු යළි අස්වැද්දීමට ගොවියන් කටයුතු කරන ලද අතර ඒ සඳහා දැනට වසරක කාලයක් ගත විය. එම ගොවීන්ට ඒ සඳහා රජය විසින් ලබා දීමට නියමිතව තිබූ අධාර මුදල් මේ වනතුරු ලැබී නැහැ. එම නිසා ගොවීන්ට එම ආධාර කඩිනමින් ලබා දීමට අවශ්‍ය ආයතන දැනුවත් කරන්න.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්, මෙතුමාගේ යෝජනාවට ඌණ පූර්ණ එක් කිරීමට කැමතියි. පසුගිය මහ කන්නයේ පුරන් වූ කුඹුරු අස්වැද්දීමට ගොවීන් කටයුතු කලත් මේ වන තුරු ආධාර නොළැබීම නිසා ගොවි මහතුන් අසරණ වී සිටිනවා. දින 60 ක් පමණ ඉක්මවා ගියත් තවමත් චෙක්පත් ලැබී නැහැ. නිලධාරීන්ගේ ප්‍රමාදවීම් නිසා ගොවි ජනතාව අසරණ වී සිටින ඔවුන් ක්‍රමවේදය පිළිබඳව දැනුවත් නෑ.
චෙක්පත් ලබා දීමට දින 60 ක් පමණ ගත වීම ගැන කණගාටු වන අතර මේ පිළිබඳව ගොවිජන කොමසාරිස්තුමිය දැනුවත් කර කඩිනමින් එම ආධාර ලබා දීමට අවශ්‍ය පියවර ගන්න.

කුඩා තේවතු සංවර්ධන නිලධාරිතුමිය පිළිබඳව මධ්‍යස්ථ මතයක සිටිනවා. නිලධාරිතුමිය අභියෝග කරන්නේනම් මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන්න. සදුදා බදාදා එතුමිය පැමිණෙනවා. එතුමියට අවශ්‍ය නම් සාකච්ඡා කර විසඳා ගැනීමට කැමැතියි. එසේ නොවන්නේනම් සාධාරණ පරීක්ෂණයක් පවත්වන්න. ලිඛිතව තොරතුරු ලබා දීමට කටයුතු කරනවා.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමන්,
පසුගිය දිනෙක දියණියගේ වැඩිවිය පැමිණීමේ උත්සවය පැවැත්වුණා. සභාවෙන් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ආධාර ලබා දෙමින් උපකාර කළා. ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමා, ලේකම්තුමිය, ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරින්ට ස්තූතිය ප්‍රකාශ කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

හෙලපත්දෙනිය, පින්නකන්ද මාර්ගය සංවර්ධනය කරමින් පවතිනවා. එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා බෝක්කු 12 ස්ථාපිත කිරිමට නියමිතව පවතිනවා. එහි එක් බෝක්කුවක් ස්ථාපික කිරිම සඳහා මසක පමණ කාලයක් ගතවෙනවා. ඒ හේතුවෙන් තේ දළු රැගෙන යනු ලබන ලොරි රථ වලට, පොදු මගී ප්‍රවාහන බස්රථ සඳහා ගමන් කිරිමට හැකියාවක් නැහැ.
මේ නිසා ප්‍රදේශයේ ජනතාව ගැටලු රැසකට මැදී වී සිටන බැවින් කඩිනමින් මෙම මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට අදාල ආයතන දැනුවත් කරන්න.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
කෘෂි කාර්මික කටයුතු පවත්වාගෙන යාම සඳහා බල ප්‍රදේශයේ ගොවිජනතාවට පොහොර නොළැබීම නිසා ගොවිජනතාව අසරණ වෙලා. වගා කරන ලද ගොයම් අඩියක් උස නැහැ. කෘෂි කටයුතු පිළිබඳව ගොවි නියාමකවරු සොයා බලන්නේ නැහැ. රජයේ නිලධාරින් උනන්දු වන්නේ නම් ගොවියන් මේ තරම් අසරණ වන්නේ නැහැ. රතුකුඩු ලැබී නැහැ. ගොවි නියාමකවරුන් දැනුවත් කර රතු කුඩු ගෙන්වීමට කටයුතු කරන්න.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
පසුගිය මස පළමු වන දින පැවැති ව්‍යාපෘති වාර්තා සකස් කිරීමේ පුහුණු පාඨමාලාවට සහභාගීවීමට මට අවස්ථාව හිමි වුණා. ඒ සඳහා මාහට අවස්ථාව ලබා දුන් ගරු සභාපතිතුමාට, ලේකම්තුමියට, සහ විෂය භාර නිලධාරිනියට ස්තූතිය ප්‍රකාශ කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දැක්වීම අනුව,

බල ප්‍රදේශයේ තුල අයිතිකරුවන් නොමැතිව අයාලේ මහ මඟ සැරිසරණ ගව සම්පත විධිමත් පරිදි ගාල් කර නීත්‍යානුකූල ආකාරයට බෙදා දීමට අවස්ථා කිහිපයකදී උත්සහ කලත් ඊට විරුද්ධව අදහස් ඉදිරිපත් වීම නිසා එම ගැටලුව සාර්ථක ලෙස විසඳාලීමට නොහැකි වුණා.

එහෙත් පවතින කිරිපිටි හිඟයට විසඳුමක් වශයෙන් අයාලේ සැරිසරණ ගවයන් ගාල් කර කිරි නිෂ්පාදනයට දායක කර ගැනීමට හැකියාව පවතිනවා. එමඟින් පිටරට යවන අතිවිශාල මුදලක් රටට ඉතිරි කර ගැනීමට හැකියාව පවතිනවා. සත්ත්ව අපද්‍රව්‍ය භාවිතයෙන් පොහොර නිෂ්පාදනයට දායක කර ගැනීමට හැකියාව පවතිනවා. මේ සඳහා රජයේ ඉල්ලීම් පවතිනවා. මේ නිසා බල ප්‍රදේශය තුල ඉඩම් කොටසක් ලබා දෙන ලෙසට මීට පෙර අවස්ථාවකදී ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත ඉල්ලුම් කල අතර නැවත මේ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරනවා.

ව්‍යාපෘති වාර්තා සකස් කිරීමේ පුහුණු වැඩමුළුවට සහභාගී වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා ස්තුතිය ප්‍රකාශ කලා. මන්ත්‍රීවරයෙක් ලෙස ඔබතුමා ඒ සඳහා සහභාගී වීමම විහාල සතුටක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සභාව සතුව පවතින වත්කම් ආරක්ෂා කිරීම සභාවේ වගකීමක් බැවින් රයි ගාමන්ට් එක අසල ඉඩම සභාව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනවා. මෙම ඉඩම් කොටස දීර්ඝ කාලයක සිට සභාව විසින් භුක්ති විඳ නැහැ. මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අදාල පුද්ගලයන් කැඳෙව්වා. ගම සමඟ පිළිසඳර වැඩසටහන තුලින් මෙම ඉඩම මැදින් මාර්ගයක් ඉල්ලා තිබෙනවා. සභාව විසින් ගනු ලබන තීරණවලට එකඟතාවය පල නොකරන්නේනම් නීත්‍යානුකූල ආකාරයට සන්තකය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරනවා.
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගෙන් කොපමණ පිරිසක් එන්නත් මාත්‍රා තුනම ලබා ගැනීමේ ප්‍රගතිය පිළිබඳව ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් විමසා බැලීමට කටයුතු කරනවා.
එමෙන්ම අතිගරු ජනාධිපතිතුමා විසින් එන්නත් කරණය පිළිබඳව විශේෂ ස්තුතියක් පල කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර එතුමාට ස්තුතිය පල යැවීමට ද කටයුතු කරනවා.
නිවාස කමිටුව විසින් ගනු ලැබූ තීරණ පිළිබඳව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත දන්වා යැවීමට කටයුතු කළා. නැවත වරක් ඒ පිළිබඳ විමසා බැලීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා අදහස් දැක්වීම අනුව,
පුරන් වූ කුඹුරු යළි අස්වැද්දීම සඳහා රජය විසින් ලබා දීමට නියමිත ආධාර මුදල් ලබා දීමට පියවර ගන්නා ලෙස ප්‍රාදේශීය ම්බන්ධිකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කලා. නියමිත ක්‍රමවේදය අනුව පුරන් වූ කුඹුරු යළි අස්වැද්දීම සිදුකර ඇත්නම් එම ආධාර ලබා ගැනීමට හැකියාව පවිතන බැවින් ඒ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරනවා. චෙක්පත පැමිණීමට මාස දෙකක කාලයක් ගත වීම ගැන අතිශය කණගාටුයි. ඒ පිළිබඳව ගොවිජන සේවා කොමසාරිස්තුමිය දැනුවත් කිරීමට කිරිමට පියවර ගන්නවා.

කුඩා තේවතු සංවර්ධන නිලධාරිතුමිය නිර්දෝෂී බැවින් පරීක්ෂණයක් පවත්වන ලෙස එතුමිය ප්‍රකාශ කරනවා. අදාල තොරතුරු ලබා දුන් පසුව මේ පිළිබඳව නැවත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනවා.
දියර පොහොර සම්බන්ධ ගැටලුව පිළිබඳ තොරතුරු ලේකම්තුමිය වෙත ලබා දෙන්න. ඒ පිළිබඳව ගොවිජන සේවා කොමසාරිස්තුමිය දැනුවත් කිරීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දැක්වීම අනුව,
හෙලපත්දෙණිය පින්නකන්ද මාර්ගය කඩිනමින් සංවර්ධනය නොකිරීම නිසා ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවයන්ට පත්ව ඇති බැවින් එම මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලෙස විධායක ඉංජිනේරු කාර්යාලය දැනුවත් කරනවා. පිටපත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමාට යොමු කිරීමට කටයුතු කරන අතර සංවර්ධනය කරනු ලබන සියලුම මාර්ගයන් නිසි ප්‍රමිතියෙන් යුතුව කඩිනමින් සංවර්ධනය කරන ලෙසට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත දන්වා යවනවා.

.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දැක්වීම අනුව,
බල ප්‍රදේශයේ ගොවි ජනතාවට කෘෂි පර්යේෂණ නිලධාරින්ගේ සහය නොළැඹෙන බව ප්‍රකාශ කලා. ඒ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

මාධ්‍යවේදි මහතුන් විසින් සභාවේ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම සඳහා විශාල සහයෝගයක් මාධ්‍ය තුලින් ලබා දෙනු ලබනවා. එහෙත් පසුගිය දිනෙක බල ප්‍රදේශය තුල නාඳුනන මළ සිරුරක් මිණී පෙට්ටියක් නොමැතිව මිහිදන් කල බව පුවත්පතක පල කර තිබුණා. එහෙත් එය වැරදි ඉදිරිපත් කිරිමක් දේහය මිහිදන් කරනු ලැබුවේ මිණී පෙට්ටියක් සහිතවයි. සභාවට විරුද්ධව විවේචන ඉදිරිපත් කලත් ඒ සෑම අවස්ථාවන්වලදී ම සභාපතිතුමාගෙන් සහ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අදහස් විමසා බලා එම කටයුතු සිදු කිරීම සුදුසු බව දන්වා සිටිනවා.

## (09). ඊ ළඟ සභා වාරයට දින නියම කිරීම.

මීට පෙර සභාවාරයක දී මහ සභාව පැවැවෙන දින තීරණය කල ද කාර්යාලයීය කටයුතුවල පහසුව සඳහා 2022 මාර්තු මස 15 වන අඟහරුවාදා දින ඊ ළඟ මහ සභාව පැවැත්වීම සුදුසු බව යෝජනා කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
ඒ අනුව 2022 මාර්තු මස 15 වන අඟහරුවාදා දින ඊ ළඟ මහ සභාව පැවැත්වීමට අදාල යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (10). ස්තූති කතාව හා අවසානය.

හත්වන සභාවේ හතළිස් අටවන සභාව සඳහා පැමිණි ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 11.55 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.